දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

ඉප්‍ර 1.1 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා)
HY 1.1 – History of Sri Lanka (From the beginning to 1500 AD)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

(01) මහසෙන් රජතුමාගේ රාජ්‍ය සමය අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා මහාවංසයෙහි ඇති වැදගත්කම පරීක්‍ෂා කරන්න.

(02) පහත සඳහන් තේමා යටතේ දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.
- (i) මෞර්ය අධිරාජ්‍යය සමඟ රජුගේ දේශපාලන සම්බන්ධතා
- (ii) බුද්ධ ශාසනය පිහිටුවීම
- (iii) සංස්කෘතික අභිවර්ධනය

(03) දිවයින එක්සේසත් කිරීමෙහිලා මාගම පාලකයන්ගේ දායකත්වය පහත දැක්වෙන ප්‍රකාශන කෙරෙහි අවධානය යොමු කරමින් පරීක්‍ෂා කරන්න.
- (i) පූර්ව දුට්ඨගාමණී අභය රජු දවස මාගම පාලකයන් අනුගමනය කළ දේශපාලනික ක්‍රියාකලාපය
- (ii) දුට්ඨගාමණී අභය රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය

(04) "අනුරාධපුර යුගයේ වාරිමාර්ග පද්ධතිය, පැරණි ශ්‍රී ලංකා ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨතම දායාදයයි" මේ කියමන සාකච්ඡා කරන්න.

(05) එක්කෝ
පළමුවැනි විජයබාහු රජුගේ දේශපාලනික හා සංස්කෘතික කාර්ය සාඵල්‍යය මූලාශ්‍ර ඇසුරෙන් සාකච්ඡා කරන්න.

නැත්නම්
ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම සම්බන්ධයෙන් පළමු වැනි පරාක්‍රමබාහු රජුගේ ක්‍රියාකලාපය විමර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

(06) රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීමට තුඩු දුන් ප්‍රධාන සාධක කවරේ ද?

(07) පශ්චාත් පොළොන්නරු යුගය හා සම්බන්ධ පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම ප්‍රමාණ කරන්න.

(i) දඹදෙනි යුගයේ සාහිත්‍ය
(ii) ගම්පොල අවධියෙහි ගෘහ නිර්මාණ ශිල්පය
(iii) යාපනයේ ආර්ය චක්‍රවර්ති පාලකයන්
(iv) අලකේශ්වර පවුලේ අගනගරය ලෙස රයිගම රාජ්‍ය නැගී ඒම
(v) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය

(08) "හයවන පරාක්‍රමබාහු රජුගේ දීර්ඝ රාජ්‍ය සමය යුද්ධය මෙන්ම සාමය සම්බන්ධ කාර්ය සංසිද්ධීන් අතින් ශ්‍රී ලංකා ඉතිහාසයේ අවසන් කීර්තිමත් අවධිය විය" සාකච්ඡා කරන්න.

.....................................